**IPRC/16/284**

# කොහොඹා යක් කංකාරියෙහි හත්පද නර්තනය පිළිබඳ අධ්‍යයනයක්

අසංක ජයරත්න[1*]

කොහොඹා යක් කංකාරියට අයත් හත්පද නර්තනයෙහි පූජාර්ථය, වර්තමාන නර්තන අධ්‍යාපනය තුළින් ගිලිහී යාමට තුඩු දෙන කරුණු ගවේෂණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණු වේ. 'හත්පදය' කොහොඹා යක් කංකාරියෙහි ආතුර රෝග දෝෂ නිවාරණය හා සශ්‍රිකත්වය අරමුණු කරගත් ශාස්ත්‍රීය නර්තනාංගයකි. පූජා භාණ්ඩ හතක් දෙවියන්ට කැප කිරීම සඳහා කෙරෙන ගායනා රහිත ඒකල නර්තනාංගයක් වශයෙන් මෙය හැඳින්විය හැකි ය. එසේ වුවද වර්තමාන අධ්‍යාපන ප්‍රවණතාවන්හි ප්‍රතිඵලයක් ලෙස මෙකී හත්පදයෙහි ඇති ශාස්ත්‍රීය හර පද්ධතීන් අනිසි ලෙස බැහැර කොට හුදු නැටුමක් බවට පත් කොට ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ උඩරට සාම්ප්‍රදායික ගුරුකුල නර්තනය පිළිබඳ තුලනාත්මක ගවේෂණයක් නොමැති වීම හා එහි ආකෘතිය පිළිබඳ නිසියාකාර අධ්‍යයනයක් සිදු නොකිරීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 'හත්පද' පිළිබඳ ලබා දී ඇති වැරදි අර්ථකථන මෙන් ම නර්තන අංගහාර, භාව, තාල හා බෙර පදවල ද අවභාවිතයක් දැකිය හැකි ය. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාව වැදගත් වන්නේ උඩරට සාම්ප්‍රදායික ලක්ෂණ සංරක්ෂණය කොටගත් නිවැරදි හත්පද ආකෘතියක් ස්ථාපිත කිරීමට හැකියාව ලැබෙන බැවිනි. මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ නියැදි වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම කංකාරි අත් පිටපත්, ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා හා පර්යේෂකයාගේ අත්දැකීම් ද උපයෝගී කරගැනීමට අපේක්ෂිත ය. මෙකී පර්යේෂණ දත්ත අනුසාරයෙන් කොහොඹා යක් කංකාරියේදී උපයුක්ත හත්පදයෙහි ශාස්ත්‍රානුකූල ලක්ෂණ මෙන් ම නිවැරදි අංගහාර, භාව, තාල, බෙරපද මෙන් ම අභිප්‍රේතාර්ථ ද මැනැවින් සංරක්ෂණය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

***ප්‍රමුඛ පද:*** *කොහොඹා යක් කංකාරියල හත්පදය, පූජාර්ථය, අංගහාර, ගුරුකුල*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව * asankadart@gmail.com